# රූපවාහිනියේ විකාශය වන පුවත්පත් සිරස්තල වැඩසටහන් මගින් පුවත්පත් පාඨකත්වයට සිදු වන බලපෑම

එ.එම්.එම්. සි. කේ. අත්තනායක[1]

සෑම රූපවාහිනී නාලිකාවකම පාහේ උදෑසන විකාශය වන පුවත්පත් සිරස්තල වැඩසටහන් මගින් මෙරට පුවත්පත් මාධ්‍ය තුළ සංධිස්ථානයක් ඇති විය. උදෑසන රැකියාවට යාමට පෙර හෝ එදිනෙදා වැඩ කටයුතු කරන අතරතුර දවසේ වැදගත් සිදුවීම් පිළිබඳව විනාඩි තිහක් වැනි කෙටි කාලසීමාවක් තුළ මෙමගින් දැනගැනීමට හැකි වීම පුද්ගලයාගේ කාර්යබහුල ජීවන රටාවට බොහෝ සෙයින් වැදගත් වේ. නමුත් මෙවැනි වැඩසටහන් මගින් පුවත්පත් කියවීමට හෝ මිලදී ගැනීමට බලපෑමක් සිදු වී තිබේද යන්න අධ්‍යයනය කළයුතු කරුණකි. මේ නිසා මෙවැනි රූපවාහිනී වැඩසටහන් මගින් පුවත්පත් පාඨකත්වය බලපෑමක් සිදු කරයිද? එසේනම් ඒ කෙසේද? යන ගැටලුව හේතු කොට ගනිමින් මෙම පර්යේෂණය මගින් විග්‍රහ කෙරිණි.LMRB (Lanka Market Research Bureau) වාර්තාවේ තක්සේරු කිරීම් අනුව රූපවාහිනී නාලිකා තුනක පුවත්පත් සිරස්තල වැඩසටහන් තුනක් සමීක්ෂණ ක්ෂේත්‍රය ලෙස ගැනුනි. එනම්, "දෙරණ අරුණ" වැඩසටහන,"පත්තරේ විස්තරේ","දවසේ පත්තර" යන වැඩසටහන්ය. බස්නාහිර පළාතේ ජන අනුපාතය අනුව ගම්පහ දිස්ත්‍රික්කය තුළ සම්භාවිතා නොවන පහසු නියැදිය යටතේ ප්‍රශ්නාවලී පනහක් ග්‍රාහක සමීක්ෂණ ක්ෂේත්‍රය ලෙස සඳහා යොදා ගැනුනි. මීට අමතරව පුවත්පත් සිරස්තල වැඩසටහන් තුනෙහි නිවේදකයන් තිදෙනා ඇතුළු පුවත්පත් කලාවේ ප්‍රවීණයන් දස දෙනෙක් සමග සම්මුඛ සාකච්ඡා පැවැත් වූ අතර පුවත්පත් මිලදී ගැනීම සහ අලෙවිය පිරික්සීමේ අරමුණින් සම්භාවිතා නොවන පහසු නියැඳිය යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ පුවත්පත් අලෙවි කළමණාකරුවන් සය දෙනෙක් සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි. මැයි පළමුවනදා සිට මැයි දහ වනදා දක්වා රූපවාහිනී නාලිකා තුනෙන් පුවත්පත් සිරස්තල වැඩසටහන් තිහක් ගෙන අන්තර්ගත විශ්ලේෂණයක් සිදු කෙරුණි.පුවත්පත් සිරස්තල වැඩසටහන් මගින් පුවත්පත් පාඨකත්වය බිඳවැටීමක් සිදු වී නොමැති අතර එම වැඩසටහන් පුවත්පත් පාඨකත්වයට යහපත් අන්දමින් බලපා ඇත. මෙම වැඩසටහන් බිහි වීමෙන් අනතුරුව නව පුවත්පත් රාශියක් බිහි වී ඇති අතර ඒවා නම් "රිවිර" , "අද", "දේශය", ආදී වශයෙන් හඳුන්වා දීය හැකිය. ප්‍රේක්ෂකයා මෙම වැඩසටහන් නැරඹීමට මූලික වශයෙන් බලපා ඇත්තේ පුවත්පත් කියවීමට වඩා රූපවාහිනිය නැරඹීමට පහසු වීමයි. වැඩසටහන් අන්තර්ගතය කෙබඳු ස්වභාවයක් උසුලන්නේද යන්න අන්තර්ගත විශ්ලේෂණයෙන් අනාවරණය විය. ප්‍රේක්ෂකයා වැඩි වශයෙන් නරඹන්නේ " දෙරණ අරුණ" වැඩසටහන බව සමීක්ෂණයේදී හෙළි විය. ඒ අනුව පැහැදිළි වූයේ රූපවාහිනියේ විකාශනය වන පුවත්පත් සිරස්තල වැඩසටහන් මගින් පුවත්පත් පාඨක පිරිසෙහි වෙනසක් සිදු වී නොමැති අතර එම වැඩසටහන් පුවත්පත් පාඨකත්වයට යහපත් අන්දමින් බලපා ඇති බවයි.

[1] සහකාර කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, madhuaththanayaka@gmail.com